# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/02/15/75 නිදහස් සමරුව | ඔබේ අංකය / உமது இல / Your No: ........................ | දිනය / திகதி / Date: 2022.02.10 |

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

සියළුම දිස්ත්‍රික් අධ්‍යකෂවරුන්,

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් / සහකාර අධ්‍යක්ෂවරුන්,

සියළුම සමෘද්ධි කළමනාකරුවන් හා සමෘද්ධි සංවර්ධන නිළධාරීන් වෙත.

**<u>75 වන දියමන්ති ජුබිලි නිදහස් සමරුව.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යංශ උපදෙස් වලට අනුව සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයංරැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යංශය මගින් 75 වන නිදහස් දියමන්ති ජුබිලිය නිමිති කරගෙන 2022.02.04 දින සිට 2023.02.04 දින දක්වා වසර පුරා ක්‍රියාත්මක කලහැකි ලෙස ආක්‍රමණික ශාක ඉවත් කිරීමේ ශ්‍රමදාන හා පැල සිටුවීමේ වැඩසටහන් සංවිධානය කරන ලෙස දන්වා ඇත. ඒ අනුව ප්‍රජාමූල බැංකු සමිතියේ අධීක්ෂණය යටතේ ප්‍රජාමූල බැංකු කේන්ද්‍ර කර ගනිමින් ග්‍රාම නිළධාරී වසම් මට්ටමින් ප්‍රජමූල සංවිධානවල සහය ලබා ගනිමින් වැඩසටහන් සංවිධානය කර මෙම ජාතික කර්තව්‍යයට දායකත්වය සැපයීම අවශ්‍ය වේ.

02. ශ්‍රමදාන හා පැලසිටුවීමේ වැඩසටහන් සංවිධානය කිරීමේදී සහාය සේවාවන්ට සම්බන්ධ ආයතන හා නිළධාරීන්ගේ මෙන්ම වෙනත් ස්වේච්ඡා සංවිධානවල සහායද ලබා ගැනීමට කටයුතු කල යුතුය.

03. පැල සිටුවීමේදී දේශීය ආහාර හා පළතුරු පැල වර්ග සිටුවීම මගින් අනාගත ආහාර අවශ්‍යතාවය සඳහා දායකවීම. (උදා:- කොස්, දෙල්, අඹ, දොඩම්). සෑම ග්‍රාම නිළධාරී වසමක්ම ඉලක්ක කර ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලබාදෙන අතර සමෘද්ධි ලාභීන්ගේ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ලෙස පැල තවාන් හා කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතිවල සහය මේ සඳහා ලබා ගැනීමට සියලුදෙනා එක්ව කටයුතු කල යුතු වේ.

04. සමෘද්ධිලාභීන් හා සමෘද්ධිලාභීන් නොවන ප්‍රජාමූල සංවිධාන සාමාජිකයින් හා සමෘද්ධි ප්‍රජාමූල බැංකු ගණුදෙනුකාර ප්‍රජාව ඉලක්කකර ඒ ඒ ප්‍රදේශ හා භූගෝලීය, පාරිසරික විවිධත්වය අනුව නිර්මාණශීලී වැඩසටහන් සංවිධානය කිරීම.

05. ආක්‍රමණික ශාක ඉවත් කිරීමේ ශ්‍රමදාන සංවිධානය කිරීමේදී අදාල ආයතනවල උපදෙස් පරිදි එම ශාක ඉවත් කිරීම හා විනාශ කිරීමට සහයවීම. (උදා :- වන සංරක්ෂණ, වනජීවී,ගොවිජන සේවා, කෘෂිකර්ම වැනි දෙපාර්තමේන්තු, පරිසර අධිකාරිය හා පළාත් පාලන ආයතන) මෙවැනි වැඩසටහන් සෑම වසමකම එකක්වත් වන ලෙස සංවිධානය කිරීම තුලින් සමෘද්ධි ප්‍රජාවගේ ශ්‍රමදායකත්වය සමගින් රටේ සංවර්ධනයට එක් කර ගැනීමට ද හැකියාව ලැබෙනු ඇත. ඒ සඳහා සුදුසු ක්‍රමවේදයක් ඒ ඒ ප්‍රජාමූල සංවිධාන කේන්ද්‍ර කර සකස් කිරීම අත්‍යාවශ්‍ය වේ.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887** |

06. ඔබ විසින් සංවිධානය කරනු ලබන වැඩසටහන් පිළිබඳ විස්තර වසම් මට්ටමින් ලබාගෙන එක් ප්‍රජාමූල බැංකුවක් පදනම්ව ආකෘති අංක 01 හා 02 මගින් microfinanceall2021@gmail.com විද්‍යුත් ලිපිනයට Microsoft Excel මගින් 2022.02.28 දිනට පෙර යොමුකරන්න.

ආර්.පී.බී. තිලකසිරි,

අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත් :-

01. ලේකම්, සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයංරැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය. - කරු.දැ.ගැ.ස.
02. අධ්‍යක්ෂ (ජීවනෝපාය සංවර්ධන), සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව.- දැ.ගැ.ස. හා අ.ක.ස
03. අධ්‍යක්ෂ (සමාජ සංවර්ධන), සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - දැ.ගැ.ස. හා අ.ක.ස.
04. අධ්‍යක්ෂ (ප්‍රජාමූල සංවිධාන), සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
05. අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය), සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස.